# 11 උක්ත ආඛ්‍යාත සම්බන්ධය II

## වාක්‍යයක කර්තෘ උක්ත ව හෝ අනුක්ත ව යෙදෙන අවස්ථා

1. අනියමාර්ථ හෝ කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියාපදයකට පෙර යෙදෙන කර්තෘ, අනුක්ත වේ.

   i. **ගායිකාවක** සංගීත ප්‍රසංගයට **ආවොත්**, බොහෝ දෙන සතුටු වෙති.
   ii. **මා** උසස් ලෙස **සමත් වුණොත්**, අම්මා සතුටු වන්නී ය.
   iii. **අප** අවංක **වුව හොත්**, කවුරුත් අපට ප්‍රශංසා කරති.
   iv. **ගුරුවරුන්** රැස්වීම **අමතද්දී**, ළමයි අත්පොළසන් දුන්හ.
   v. **සේවකයන්** පාර **කපද්දී**, මිනිස්සු එදෙස බලා සිටිති.
   vi. **ගෙහිමියන්** රූපවාහිනිය **නරඹද්දී**, සොරු ගෙට ඇතුළු වූහ.

2. සංශයාර්ථයක් හෝ වාර්තාවක් හෝ ප්‍රකාශ කරන විට, අන්තර් වාක්‍යයේ කර්තෘ අනුක්ත වන අතර, අන්තර් වාක්‍යයේ ක්‍රියාපදය ප්‍රථම පුරුෂ බහුවචනයෙන් යෙදේ. ප්‍රධාන වාක්‍යයේ ක්‍රියාව උක්තයට අනුව තබනු ලැබේ.

   i. **දරුවන්** හොඳින් ඉගෙන **ගනිති'** යි දෙමාපියෝ සිතති.
   ii. **මදුරුවන්** රෝග **බෝකරති** 'යි වෛද්‍යවරු පවසති.
   iii. **දරුවකු** වේදනාවෙන් **ඇඬූහ**'යි ගුරුතුමිය පැවසුවා ය.
   iv. **ගස් වැල්** පරිසරය අලංකාර **කරති**'යි පරිසරවේදීහු ප්‍රකාශ කරති.
   v. හෙට **මිනිසුන්** වැඩට **නො එති**'යි කළමනාකරු සිතයි.
   vi. **පරසතුරන් එති** එති යන බසටා
   vii. **කතී** වෙණ **මීයන**
   viii **සොරුන්** කැලෑවේ සැඟවී **සිටිති**'යි පොලිසිය සැක කරයි.

3. යුතු ය, මැනවි, යෙහෙකි, ඇත, නැත වැනි පදයකින් වාක්‍යය අවසන් වන විට උක්තය අනුක්ත වේ. "ඇත" "නැත" යන රූපවලට පෙර පූර්ව ක්‍රියාවක් හෝ කෘදන්ත රූපයක් හෝ නො යෙදේ නම් එම වාක්‍යයේ උක්තය උක්ත ස්වරූපයෙන් ම තැබිය යුතු ය.

   i. පන්තියේ **ළමයි** ඇත.
   ii. පාසලේ **ගුරුවරු** නැත.
   iii. **පදිකයන්** පාරේ දකුණින් **යා** යුතු ය.
   iv. **ක්‍රීඩකයන්** සතතාභ්‍යාසයෙහි **යෙදීම** මැනවි.
   v. **දරුවන්** සැම විට අවංක **වීම** යෙහෙකි.
   vi. **ශිෂ්‍ය නායකයන්** රැස්වීමට **සහභාගි වී** ඇත.
   vii. **ගොවියන්** අද වප්මඟුල් උත්සවයට **පැමිණ** නැත.

4. ඇත, නැත යන රූප සමඟ පූර්ව ක්‍රියා රූපයක් හෝ භාව ක්‍රියා රූපයක් හෝ යෙදුණු විට කර්තෘපදය අනුක්ත රූපයෙන් සිටී.

   i. **මා** ඒ පොත **කියවා** නැත.
   ii. පන්තියට **ළමයින් පැමිණ** ඇත.
   iii **ආරාධිතයන්** රැස්වීම **අමතනු** ඇත.

5. "හෝ" නිපාතයෙන් වාක්‍යය සම්බන්ධ වන විට ආසන්න ම උක්තයට ගැළපෙන සේ ආඛ්‍යාතය තැබිය යුතු ය.

   i. මව හෝ **පියා** හෝ රැස්වීමට සහභාගි **වෙයි.**
   ii. පියා හෝ **මව** හෝ රැස්වීමට සහභාගි **වන්නී ය.**
   iii. අක්කා හෝ **මම** හෝ අම්මාට උදවු **වන්නෙමි.**

6. හා, ද, ත්, යි, සහ ආදි නිපාත පද සමුච්චයාර්ථයෙහි යෙදීමේ දී ආඛ්‍යාතය බහු වචනයෙන් යෙදේ. මෙහි දී පිළිවෙළින් උත්තම, මධ්‍යම හා ප්‍රථම පුරුෂ බලවත් වේ. ආඛ්‍යාතය ඒ අනුව තිබිය යුතු ය.

   i. තාත්තා ද අම්මා ද **මම** ද කුඹුරට **ගියෙමු.**
   ii. ආචාර්යවරයා ද **ඔබ** ද පාසල් **ගියෙහු.**
   iii. ගොවියා සහ **ගෙවිලිය** ගොයම් **කපති.**

7. කෝ, කොයි, කවරහු ද ආදි පද යොදා ප්‍රශ්න ඇසීමේ දී උක්තය උක්ත ස්වරූපයෙන් ම සිටී.

   i. මේ පන්තියේ **ළමයි** කෝ?
   ii. මේ බසයේ පැමිණි **මඟීහු** කවුරු ද ? / කවරහු ද?
   iii. මේ ගෙදර **මිනිස්සු** කොයි ද?
   iv. වැඩිමාලු **පුතණුවෝ** කොයි ද ?

8. "හෙවත්" යන නිපාතයෙන් වාක්‍ය සම්බන්ධ වන විට, කර්තෘ පද දෙකම උක්ත වන අතර, ඒ හා ගැළපෙන සේ ආඛ්‍යාතය යෙදිය යුතු ය.

   i. **මව්පියෝ** හෙවත් **පූර්ව ආචාර්යවරු** අප යහමගට යොමු **කරති.**
   ii. නූතන **ජීවකවරු** හෙවත් **වෛද්‍යවරු** සැමට සහනය **සලසති.**

9. "නොහොත්" නිපාතය යෙදෙන විට ආඛ්‍යාතයට ආසන්න ව යෙදී ඇති උක්ත පදයට ගැළපෙන සේ ආඛ්‍යාතය යෙදිය යුතු ය.

   i. පියා නොහොත් **මම** රැස්වීමට සහභාගි **වෙමි.**
   ii. මම නොහොත් **පියා** රැස්වීමට සහභාගි **වෙයි.**

10. **ඇයි, කෙසේ ද, කවර දා ද, මොනවා ද වැනි ප්‍රශ්නාර්ථ යෙදුම් සමග බැඳෙන කර්තෘපදය අනුක්ත රූපයෙන් සිටී.**

i. **මිනිසුන්** අවංක නො වන්නේ ඇයි ?
ii. දක්ෂ **ක්‍රීඩිකාවක** වන්නේ කෙසේ ද?
iii. **අප** සාමය ළඟා කරගන්නේ කවර දා ද?
iv. සංගමයේ **සාමාජිකයන්** බලාපොරොත්තුවෙන්නේ මොනවා ද ?

11. **අතීත හෝ වර්තමාන හෝ කෘදන්ත පදයකට මුලින් යෙදෙන කර්තෘ පදය අනුක්ත වේ.**

i. අකීකරු **දරුවකු වූ** දඟදාස පසු ව යහපත් ළමයෙක් විය.
ii. **ලේඛකයකු වූ** ඔහු දක්ෂ ගායකයෙක් ද විය.
iii. දඟකාර **දරුවකු ව** සිටි ඔහු යහපත් දරුවකු වී පාසලින් පිට විය.
iv. දක්ෂ **ගායිකාවක වී** සිටි සුනිලා සිල්මාතාවක වී ජීවිතයේ සැඳෑ සමය සතුටින් ගෙවුවා ය.
vi. **ළමයින්** ශාරීරික අභ්‍යාසවලට **යනවා** මම දුටුවෙමි.
vii. **දරුවන්** විනීත ව **හැසිරෙනවා** නම් ඉතා හොඳ යි.
viii. **අප** මිහිරි හඬින් **ගැයුවේ** නම් ශ්‍රාවකයෝ සතුටු වෙති.

12. **කර්මකාරක වාක්‍යයක " විසින් " යන නිපාතයට පෙර යෙදෙන කර්තෘ අනුක්ත විය යුතු ය. මෙහි දී කර්මය උක්ත වේ. ක්‍රියා පදය ඒ අනුව තිබිය යුතු ය.**

i. **ගුරුවරුන්** විසින් දරුවෝ යහමඟ යැවෙති / යවනු ලැබෙති/ යවනු ලබති
ii. **දෙමවුපියන්** විසින් දරුවෝ පෝෂණය කෙරෙති / කරනු ලැබෙති / කරනු ලබති.
iii. **සේවකයන්** විසින් යෝජනා ඉදිරිපත් කෙරේ / කෙරෙයි / කරනු ලැබේ.

13. **සමග, කැටුව, වැනි, සඳහා, උදෙසා, පිණිස, මෙන්, සේ, ලවා ආදි පද මුලට යෙදෙන කර්තෘ අනුක්ත වේ.**

i. **දෙමවුපියන්** සමග දරුවෝ පාසල් යති.
ii. ගුරුතුමිය **ළමයින්** කැටුව විද්‍යාගාරයට ගියා ය.
iii. **ළමයින්** සඳහා ලියැවුණු පොත් රාශියක් ඇත.
iv. **දෙවියන්** වැනි මිනිස්සු අප අතර වෙති.
v දුව **තිළියක** මෙන් සැරසී පැමිණියා ය.
vi තා **ගොයකු** සේ බඩගා නො යව.
vii. ගුරුතුමිය **සිසුන්** ලවා පාඩම කියවයි.

14 ප්‍රශ්නාර්ථයේ "ද" නිපාතය සමග ප්‍රාණවාචී නාමපදයක් සම්බන්ධ වන කල්හි කර්තෘ උක්ත රූපයෙන් සිටී.

i. මේ දරුවෝ අනාගත පුරවැසියෝ ද?
ii. රටේ නායකයෝ අපි ද?
iii. හේ/ ඔහු ලේඛකයෙක් ද?
iv. සියලු සිංහලයෝ සැදැහැවත් බෞද්ධයෝ ද?

නාම ආඛ්‍යාත

15. නාම ආඛ්‍යාත යෝගයේ දී ආඛ්‍යාතයේ යෙදීමක් නැත; වාක්‍යයේ අවසාන නාම පදය ම ආඛ්‍යාත කාර්යය ඉටු කරයි. මෙබඳු තැන්හි ය/යි නිපාත ද යෙදේ.

i. හෙතෙම දක්ෂ පාලකයෙක්/ය.
ii ගුණපාල ක්‍රීඩාවේ ශූරයෙක්/ය.
iii. ගුරුතුමා ඉතා උගතෙක්/ය.
iv. මේ පන්තිය භාර ගුරුවරයා මම ය/යි.

16 අවිනිශ්චිතාර්ථය

අවිනිශ්චිතාර්ථය දැනවීමේ දී වාක්‍යයේ ක්‍රියාපදය අවසානයට 'වි' නිපාතය යෙදේ. කර්තෘ අනුක්ත රූපයෙන් සිටී.

i. අපේ මිතුරන් තරගයෙන් ජය ගනීවි.
ii. හරකුන් වත්තේ තණ කාවි.
iii. ඔබ වනයේ අතරමං වේවි.
iv. ගුරුවරුන් සිසු දරුවන්ට යහමග පෙන්වාවි.

17. ශ්‍රැතිසූචනාර්ථය

ශ්‍රැතිසූචනාර්ථය හැඟවීමේ දී කර්තෘ උක්ත ස්වරූපයෙන් යෙදේ. මෙහි දී ශ්‍රැතිසූචනය යනු ඇසූ දෙයක් හැඟවීම යි. ල, ලු ප්‍රත්‍යය මෙහි දී යෙදේ.

i. ඔවුහු නළුවෝ ලු.
ii. ඈ දක්ෂ නිළියක් ලු.

### 11.1 ක්‍රියාකාරකම 1

**සුදුසු පද යොදා හිස් තැන් පුරවන්න.**

1. ස්වභාවධර්මය ............................ විසින් ජය ගනු ලැබේ. (විද්‍යාඥයෙක්, විද්‍යාඥයන්)
2. මා නිවාඩුවට ගමට .................. යි පියා කල්පනා කරයි. (එමි, එති)
3. දක්ෂ .......................... වන මධුවන්ති ගී ගැයීමෙහි ද සමත් ය. (නිළියකු, නිළියක)

4. මාලිනී පාසල් .............................. ව සිටිය දී දිනූ තෑගි අපට පෙන්වූවා ය.

(ශිෂ්‍යාවක්, ශිෂ්‍යාවක)

5. ජාතික සංවර්ධනයෙහි ලා ............................. උද්යෝගයෙන් වැඩ කරතියි අපි සිතමු. (තරුණයෝ / තරුණයන් )

6. ................................ පාසලට යද්දී ගුණපාල බයිසිකලයකින් යනු මට පෙනිණි. (මම /මා)

7. ආරාධිත .......................... රැස්වීමට පැමිණි බව අපි දැන සිටියෙමු.

(අමුත්තෝ, අමුත්තන් )

8. ................................. ඒ පොත තව ම කියවා නැත. ( මම, මා )

9. උත්සවයේ වැඩකටයුතුවල නිරත වීම සඳහා ශිෂ්‍ය ..................... උදෙන් ම පාසලට පැමිණ ඇත. (නායකයන්, නායකයෝ)

10. ඈ දක්ෂ .............................. පමණක් නො ව සමාජ සේවිකාවක් ද වූවා ය. (ලේඛිකාවක, ලේඛිකාවක්.)

11. රජතුමා පුරෝහිතයන් ආදියෙහිත් ඇමැතියන් මධ්‍යයෙහිත් යන්නට නිල කොට තෙමේ අවසානයෙහි ගමන් ....................... (ගත්හ, ගති.)

12. ජාතික ගීය ගැයීමෙන් ඉක්බිති ව සභා තොමෝ සතුටින් විසිර ..........................
(ගියහ. / ගියා ය).

13. සියලු නෑදෑ ....................... මේ නිවේදනය පිළිගනිත්වා ! (හිතවත්තු / හිතවතුන්)

14. ලී කෝටුව සර්පයෙකැයි සිතූ රියදුරා බිය වූ සැටි අනෙක් අය .......................
(දුටුවේ ය/ දුටුවෝ ය.)

15. අනුරාධපුරයේ සිට ඔබ අමතන ........................ ජනසේන. (මම / මා)

16. .............................. චාරිකාවට සහභාගී වූ බව අපි දනිමු. (සාමාජිකයෝ සියල්ලෝ ම, සමාජිකයන් සියල්ලන් ම )

17. ..................... පාරේ දකුණු පසින් යා යුතු ය. (පදිකයන්, පදිකයෝ )

18. ළමයින් මත් උවදුරෙන් බේරාගැනීමට .......................... මෙන් ම ගුරුවරු ද උනන්දු විය යුත්තාහ. (දෙමවුපියෝ, දෙමවුපියන්)

19. ......................... මේ සත්‍යය වටහාගන්නේ කෙදිනක ද ? (අපි, අප)

20. පොලිසිය විසින් සොර මුළ අත්අඩංගුවට ................................

(ගන්නා ලදි, ගන්නා ලදහ.)

21. විදේශගත ව සිටින පුතණුවෝ නිතර ම සිය ............................ සිහි කරති.
(මෑණියෝ, මෑණියන් )

22. ............................... උසස් ලෙස සමත් වුණොත් දෙමවුපියෝ සතුටු වෙති.

(මම, මා)

23. ............................... සමග කම්කරුවෝ සහයෝගයෙන් වැඩ කරති.

(ඉංජිනේරුවෝ / ඉංජිනේරුවරුන්)

24. ගුරුවරු ......................... ශිෂ්‍ය නායකයෝ රැස්වීම සංවිධානය කළහ.

(හෙවත් / නොහොත්)

25. නාහිමිපාණෝ ...................... සමග දඹදිව වැඩම කරති.

(දායකයෝ / දායකයන්)

## 11.2 ක්‍රියාකාරකම 2

**පහත සඳහන් වාක්‍ය නිවැරදි කර ලියන්න.**

1. දෙමාපියන් දරුවන් සමග එතෙර සංචාරයක යෙදුණහ.
2. තම දියණියන් පිහිනීමේ ශූරියක් බව මව පැවසුවා ය.
3. රෝගීහු ඉක්මනින් සුවය ලබති යි වෛද්‍යවරු පැවසූහ.
4. විදුහලේ පැවති ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් තෑගි බෙදා දුන්හ.
5. සාධාරණ විනිශ්චයක් ලබා දුන හොත් දක්ෂයෝ දිනාවි.
6. සිසු දරුවෝ වැඩිහිටි උපදෙස් පිළිගැනීම මැනවි.
7. ගීත රචකයෙක් වූ මර්සලින් ජයකොඩි පියතුමා ස්වර්ගස්ථ වූහ.
8. වැඩිහිටියෝ දරුවන්ට ආදර්ශවත් ලෙස හැසිරිය යුතු ය.
9. යහපත් ගෘහපතිනියක් වූ ඕ තොමෝ ආදර්ශවත් මවක් ද වූහ.
10. ප්‍රශංසාවෙන් හෙවත් පැසසුමෙන් ළමයි ඉගෙනීමට පෙලඹවිය හැකි බව මනෝවිද්‍යාඥයෝ පවසති.